# තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට පරිසර විද්‍යාත්මක හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනන්ගේ අවශ්‍යතාවය

යූ.කේ.ජී. අනෝමා කුමාරි[1] , එස්.ඒ. බටුවන්තුඩාව[2]

අතීත"ලක්දිව" බොහෝ දෙනා ආමන්ත්‍රණය කරනු ලැබුවේ "වැව් බැදි රාජ්‍ය" නමිනි. අපගේ වාරිමාර්ග හා ජලවහන ක්‍රම, කෘෂි ආර්ථික ජීවන රටාව පිළිබඳ ඉතිහාසය පූර්ව ඓතිහාසික යුගය දක්වා අතීතයට ගමන් කරනු ලැබේ. පුරාවිද්‍යාත්මක සාධකවලට අනුව පූර්ව ඓතිහාසික යුගයේ මිනිසා කුඩා ජලාශ හා ඇල මාර්ග උපයෝගී කරගෙන සිය කෘෂි ආර්ථික කටයුතු සිදුකර ඇති අතර ක්‍රි.පූ. 6-3 ශතවර්ෂ වැනි ඈත යුගයේ ජනාවාස බිහිකල පූර්ව ඓතිහාසික සංස්කෘතියට අයත් මිනිසා ඇළදොළ හා ගංගා අමුණු, කුඩා වැව්, පොකුණු වැනි ජලාශ ආශ්‍රිතව ජනාවාස පිහිටුවා ගනිමින් කෘෂි ආර්ථික රටාව ඔස්සේ ප්‍රගමනය වී ඇත. මෙම අධ්‍යයනයේ දී අතීත ගැමියාගේ වැව පදනම් කරගත් ජීවන රටාව අධ්‍යයනය කිරීමත් වැව හා බැදුණු පරිසර විද්‍යාත්මක හා පුරාවිද්‍යාත්මක ලක්ෂණ අධ්‍යයනය කිරීමත් අතීත වැව් සංරක්ෂණ ක්‍රමවේදයන් අධ්‍යයනය කරමින් වර්තමාන වැව් නිර්මාණයේදී හා ප්‍රතිසංස්කරණයේදී සලකා බැලිය යුතු කරුණු යෝජනා කිරීම අරමුණු කරගෙන ඇත. පර්යේෂණ ගැටළු ඔස්සේ වර්තමාන වාරි සංස්කෘතිය තුළ ඇති පුරාවිද්‍යාත්මක හා පරිසර විද්‍යාත්මක අධ්‍යයනයන්ගේ අවශ්‍යතාවය සාකච්ඡා කෙරේ. පර්යේෂණ ක්‍රමවේදය ලෙස පුස්තකාල හා අන්තර්ජාල භාවිතය මගින් ද්විතියික දත්ත උපයෝගී කරගනිමින් සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කරන ලදි. ලංකාවේ පැරණි වැව් හා වාරිමාර්ග පිළිබඳව වාරි කළමනාකරණය හා ජලාපවාහන ක්‍රම මෙන්ම වාරි ඉන්ජිනේරු ශිල්පය පිළිබඳවත් වැව් සංස්කෘතිය හෙවත් ජලජ සමාජය පිළිබඳව විදේශ මෙන්ම දේශීය උගතුන් දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත්කර ඇත. එමෙන්ම පුරාණ වැවේ අංග ඍජුවම පාරිසරික සංරක්ෂණය උදෙසාම නිර්මාණය වී ඇත. සොරොව්ව, බිසෝ කොටුව, පිටවාන, වැව් බැම්ම ආදී පෞරාණික සාක්ෂි ඔස්සේ ඒ බව සනාථ කරගත හැකිය. වැව් ඉස්මත්ත, කට්ට කඩුව, ගස් ගොම්මන, වෙල් යාය ආදින් ඉදුරාම පරිසර විද්‍යාත්මක අංග වීම වැදගත් ලක්ෂණයකි. අද වනවිට වැව් සංස්කෘතිය මහවැලි ජල යෝජනා ක්‍රමය දක්වා විකාශනය වී ඇත. අද වන විට වැව් අමුණු, ජලාශ ආදීන් නිර්මාණයේදී හා ප්‍රතිසංස්කරණයේදී පරිසර විද්‍යාත්මක ගවේෂකයන් හා පුරාවිද්‍යා ගවේෂකයන්ගේ විධිමත් අවධානය යොමු නොවීම ගැටළුවක් බවට පත්ව ඇත. වැව නිර්මාණයේදී හා ප්‍රතිසංස්කරණයේදී පුරාණ නටබුන්වලට හානිකිරිම එයට උදාහරණයකි. ඒ අනුව පරිසර විද්‍යාත්මක ගවේෂකයන්ගේ හා පුරාවිද්‍යා ගවේෂකයන්ගේ සහය, අධීක්ෂණය මෙන්ම සමීක්ෂණය ද ලබාගනිමින් "තිරසාර පාරිසරික සංවර්ධන සංකල්පය" ඔස්සේ අතීත උරුමයන් රැකගනිමින් අනාගත පරපුරට ඒවා භුක්ති විඳීමේ අයිතිය ආරක්ෂා කර දිය යුතුය.

ප්‍රමුඛ පද : පුරාවිද්‍යාත්මක සාධක, පරිසර විද්‍යාත්මක, පුරාණ, සංරක්ෂණ, වැව්

[1 2] පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. anomarjt@gmail.com